**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනතේ 19 වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ ආයතනය සතු රු.මිලියන 13.9 ක් වටිනා වාහන 27 ක්, 2017 සහ 2018 වර්ෂයන්හීදී රු.මිලියන 85.3 ක අගයකට ප්‍රත්‍යාගණනය කර තිබුණ ද එම ප්‍රත්‍යාගණන අගයයන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම ප්‍රත්‍යාගණන ක්‍රියාවලියේ ක්‍රියා පරිපාටිය සම්පූර්ණ නොවීමෙන් මෙම අගයන් ගිණුම් මඟින් හෙළිදරව් කිරීමට නොහැකි වී ඇත. | එක් එක් වත්කම් පන්තියට අයත් වත්කම් සම්පූර්ණයෙන් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු එම අගයන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාළ කෙටි කාලීන ආයෝජන හා ලැබිය යුතු ආයෝජන පොලී ආදායම | ආයතනය අඛණ්ඩව මේ ආකාරයට ගිණුම් පවත්වා ගෙන ගිය අතර ඉදිරියේදී මෙම | ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් නිවැරදි වර්ගීකරණයන් යටතේ මූල්‍ය |

| | | |
|---|---|---|
| පිළිවෙළින් රු.මිලියන 230 ක් හා රු.මිලියන 10.4 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන වෙනම දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා තිබුණි. | විගණන වාර්තාව ප්‍රකාරව කටයුතු කරන ලදී. | තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීතිරීති, රෙගුලාසි සහ මූල්‍ය කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 134(1) හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය | ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද, 2019 ජූලි 12 දින සිට පුරප්පාඩු වී ඇති අභ්‍යන්තර විගණක තනතුර සඳහා ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතු කරනු ලබන ගණකාධිකාරිවරයෙකු ප්‍රධාන විගණක තනතුරේ වැඩබැලීමට පත්කර තිබුණි. | භාණ්ඩාගාර ලේකම්වරයාගේ අංක DMS/POLICY/requirements යන ලිපිය අනුව බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත. | මුදල් රෙගුලාසි හා ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2005 ජූලි 01 දිනැති අංක PED/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වර්ෂය තුළ අවම වශයෙන් මාස 03 කට වරක්වත් විගණන කමිටුව රැස්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්ව තිබූ වාර ගණන 02 කට පමණක් සීමා වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව වර්ෂයකට පැවැත්විය යුතු අවම රැස්වීම් වාර ගණන පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 08 හි 2.14.1 වගන්තිය | අනුරාධපුර උසස් තාක්ෂණ ආයතනයේ ආයතනික අංශය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ I අදියරට අදාළ රු.මිලියන 11.4 ක් වූ ප්‍රසම්පාදන කටයුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් හරහා ඉටුකළ යුතු වුවද අදාළ ප්‍රසම්පාදන කටයුතු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් හරහා සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මූලධර්ම හරියාකාරව අවබෝධ කර නොගැනීම නිසා සැලකිල්ලට ගෙන ඇත්තේ බඳුරහිත ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යොදා ගතයුතු වුවත්, යොදා ගෙන ඇත්තේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වේ. | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 14.1 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 33.5 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 19 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රතිපාදන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයේ යෙදී සිට එම සේවයෙන් නිදහස් කර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කර තිබූ මහාචාර්යවරයෙකු, පවිත්‍රතා සේවා ප්‍රසම්පාදනයට අදාළ ප්‍රසම්පාදන නීතිරීති හා මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධව 2018 වර්ෂයේදී චෝදනාවට ලක් වීම හේතුවෙන් එම නිලධාරියා තාවකාලිකව එම ධූරයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණ ද ඔහුට එරෙහිව අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු වාර්තාවේ දින දක්වාම අවසන් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන නීතිරීති හා මුදල් රෙගුලාසි උල්ලංඝනය කර ඇති මෙම නිලධාරියා සම්බන්ධ අදාළ විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යාම සඳහා ප්‍රදේශ 09 ක ගොඩනැගිලි ඉදිකර තිබුණ ද එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව ආයතනයට පවරා ගැනීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි. | වාර්තාවෙන් පෙන්වා දී ඇති ඉඩම්වල අයිතිය නියමානුකූල කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | ශාඛා කාර්යාල පවත්වා ගෙන යනු ලබන ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 හා 2015 වර්ෂවලදී ක්‍රියාත්මක වූ 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) මඟින් ආයතනයේ නිලධාරීන් 10 | අදාළ උපාධිය නියමිත වකවානුව තුළ සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ගෙන් එම මුදල ආපසු අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | විදේශාධාර ව්‍යාපෘති මඟින් ලබාදෙනු ලබන මුදල් ඵලදායීව උපයෝජනය කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

දෙනෙකු වෙත පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා රු.මිලියන 2.3 ක මුදලක් ලබා දී තිබුණි. එසේ වුවත් අරමුදල් ලබා දී සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වසර 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද අදාළ නිලධාරීන් එම උපාධි පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි.

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වැසිකිලි පද්ධතියකට අදාල කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත්කාර ආයතනයක් වෙත රු. මිලියන 9.6 කට 2017 මාර්තු 07 දින ප්‍රදානය කර තිබුණි. එසේ වුවත් එම ආයතනය විසින් අත්තිවාරම් දැමීම පමණක් සිදුකර 2018 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු අතහැර දැමීම හේතුවෙන් එම ආයතනයට ගෙවා තිබුණු රු.මිලියන 2.5 ක මුදල ආයතනයට නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ප්‍රදේශවාසීන්ගේ පැවති දැඩි විරෝධතාව මත ව්‍යාපෘතිය නතර කිරීමට සිදුවිය. ඒ වනවිට කොන්ත්‍රාත්කරු විසින් නිම කොට ඇති වැඩ අයිතමයන් සඳහා සහ වැඩිබිමේ ඇති කම්බි සඳහා ද මුදල් ගෙවා තිබූ අතර ඉදිකිරීම් බිමේ ඇති අමුද්‍රව්‍ය දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ අනාගත ඉදිකිරීම් සඳහා යොදා ගන්නා බව සඳහන් කරමි. | ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් පසු ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර, සැලසුම්වලට අනුකූලවන පරිදි ව්‍යාපෘතිය ආරම්භ කර ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) යටතේ දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ මහල් 05 කින් යුත් නායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ මහල් 03 ක් පමණක් රු.මිලියන 105.8 ක් වැයකර ඉදිකර තිබුණද ඉතිරි මහල් 2 නොමැතිව ප්‍රයෝජනයට ගත නොහැකි වීම නිසා ඉදිකර තිබුණු මහල් 3 සහ සවිකර ඇති උපකරණ 2017 පෙබරවාරි 21 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවතුණි. ගොඩනැගිල්ලට සවිකර තිබුණු | ඉතිරි මහල් 02හි වැඩ ආරම්භ කර නොමැති නිසා නිම කර ඇති මහල් 03, භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය අමතර වැඩ හඳුනාගෙන එය නිම කිරීම සඳහා අවශ්‍ය ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | විදේශාධාර ව්‍යාපෘතියක් යටතේ ඉදිරිකර ඇති මෙම ගොඩනැගිල්ලේ නිම කර ඇති මහල් 03 උපයෝජනයට ගැනීමටත් ඉතිරි මහල් 02 හි වැඩ කඩිනමින් නිම කිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටුකළ යුතුය. |

උපකරණ භාවිතා නොකිරීම හේතුවෙන් අනාගත ක්‍රියාකාරිත්වයට ගැටළු ඇති විය හැකි බව නිරීක්ෂණය වූ අතර උපකරණ රාශියක වගකීම් කාලය ද නිම වී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ආයතනයේ සමස්ථ සේවක පුරප්පාඩු සංඛ්‍යාව 88 ක් විය. එසේම එක් එක් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන පාඨමාලා ගණන අනුව යාවත්කාලීන කරන ලද අධ්‍යයන කාර්යමණ්ඩල සැලැස්මක් පිළියෙළ කර නොතිබීම හේතුවෙන් බාහිර දේශකවරු මඟින් වැඩි දේශන පැය ප්‍රමාණයක් ආවරණය කර ගැනීමට ද සිදුවී තිබුණි. | 2019 දෙසැම්බර් 18 වන දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ලබාදෙන ලද අවසරය මත කථිකාචාර්යවරුන් 21 දෙනෙකු බඳවා ගැනිමට කටයුතු කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 876 යටතේ බඳවා ගැනීම් කරන ලද අතර 2020 ඔක්තොම්බර් 26 වන දින DMS/Scir/2020 අනුව බඳවා ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරුන්ට පවරන ලද බලතල අනුව බඳවා ගැනීම් කටයුතු සඳහා අවසර ඉල්ලා ඇත. | තනතුරුවලට අදාළ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |